සාමණේර හිමිවරුන් ලිංගික අපයෝජනයට ලක්වීම, නීතිය ඉදිරියේ ලිංගික අපරාධයක් ලෙසින් හඳුනා ගනු ලබන වරදක් මෙන්ම, සමාජ ගැටළුවක් ද වෙයි. එහිදී, එම අපරාධයේ බරපතළ භාවය නිසි පරිදි හඳුනාගනිමින්, එම බරපතල භාවය සමාජයට ද ඒ අයුරින්ම සන්නිවේදනය කිරීම මාධ්‍ය වගකීම වේ. නමුත්, ඇතැම් මාධ්‍ය එවන් අපරාධ වාතර්‍ා කිරීමේදී, දැන හෝ නොදැන එම අපරාධ වඩාත් සැහැල්ලු කොට දක්වමින් වාතර්‍ා කරනු ද දක්නට ලැබේ. එය එවැනි අපරාධ සම්බන්ධයෙන් සමාජය තුළ ඇති ආකල්පය සැහැල්ලු වීමටත්, ඒ නයින් තවත් සමාජ ගැටළු වලටත් මඟ නොපාදනු ඇතිදැයි පාඨක අප විමසිය යුතුයි.

නාවලපිටිය විහාරස්ථානයක වැඩ සිටි සාමණේර හිමිවරුන් තිදෙනෙකු අපයෝජනයට ලක් කිරීමේ චෝදනා මත, එම විහාරස්ථානයේම වැඩ සිටි හිමි නමක් අත්අඩංගුවට ගැනීමේ සිදුවීම, මාධ්‍ය වාතර්‍ා කර ඇති අන්දම මෙහිදී අපට විමසා බැලිය හැක.

"පොඩි හිමිවරුන්ට කරදර කළැයි ලොකු හිමි නමක් රිමාන්ඩ්" - මව්බිම

"සාමණේර හිමිවරුන් තිදෙනෙකු අපයෝජනය කළැයි හිමිනමක් රිමාන්ඩ්" - අරුණ

ඔබ සිතන ලෙසට,

1) නීතියෙන් දඬුවම් ද ලැබී ඇති අපරාධයක් වන අපයෝජනයක්, "කරදර කිරීමක්" ලෙසින් දැක්වීම ඔස්සේ, එම අපරාධය සුළු කොට නොදැක්වෙන්නේ ද? ඒ ඔස්සේ මෙවැනි වරද සමාජය තුළ සාමාන්‍ය දෙයක් බවට පත් වීමේ අවදානමක් නොමැති ද?

2) ඒ අනුව, මෙම සිදුවීම වඩාත් යෝග්‍ය ලෙසින් ඉදිරිපත් වී ඇති සිරස්තල(ය) ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර්‍ කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!